අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
සිංහල භාෂා ඒකකය

282

# සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2023

පළාත් මට්ටම

01. අපේක්ෂකයාගේ නම : ..............................................................................................
(මුලකුරු සමග නිවැරදි ව ලියන්න)
02. විද්‍යාලයේ නම සහ ලිපිනය : ..............................................................................................
03. පාසල් වර්ගය : 200 අඩු / 201-500 තෙක් /500ට වැඩි
04. කලාපය : ..............................................................................
05. පළාත : ..............................................................................

## ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන

**6 ශ්‍රේණිය** | **කාලය පැය 02යි.**

I කොටසින් එකක් ද II කොටසේ (අ) යටතේ එකක් ද (ආ) යටතේ එකක් ද (ඉ) යටතේ එකක් ද වශයෙන් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

### I කොටස

1. පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150 - 200 අතර රචනයක් ලියන්න.

(අ) මිහිකත සුරකින තුරුලිය සුරකිමු
(ආ) අපේ ජන සාහිත්‍යය
(ඇ) පොත් කියවමු; ලොව ම දිනමු
(ඈ) දේශීය ආහාර රටාවෙන් සෞඛ්‍ය සම්පන්න ජීවිතයක්
(ඉ) හොඳ සිරිත් දැනගෙන සරු කර ගනිමු දිවිය ම (ලකුණු 40යි.)

### II කොටස

අ. (i) පාසල නියෝජනය කරමින් සහභාගි වූ සමස්ත ලංකා චිත්‍ර තරගයෙන් ඔබ ජයග්‍රහණය කර ඇත. ඒ වෙනුවෙන් ඔබ ගත් උත්සාහය, ලැබුණු සම්මාන, සහතික හා සුබ පැතුම් පිළිබඳ දන්වමින් ගමේ ජීවත් වන අත්තම්මාට ලිපියක් ලියන්න.

(ii) ගමේ අලුතින් පිහිට වූ දුලන ළමා සමාජය විසින් පුස්තකාලයක් ආරම්භ කරන ලදී. මේ වන විට ඔබ එහි සාමාජිකයෙකි. එහි සාමාජිකත්වය ලබා ගත්තා ලෙස දන්වමින් මිතුරෙකුට / මිතුරියකට ලිපියක් ලියන්න.

(ලකුණු 20යි.)

ආ. (i) ඔබ ලේකම් ධූරය දරන පුබුදු ළමා සමාජයේ සාමාජික සාමාජිකාවන් අලුතින් ඇරඹූ පුස්තකාලයට පොත් ලබා ගැනීමේ අරමුණින්, ගෙයින් ගෙට යන චාරිකාවක් සංවිධානය කර ඇත. මේ පිළිබඳ ප්‍රදේශවාසීන් දැනුවත් කිරීමට සුදුසු දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න.

(ii) ඔබ ප්‍රදේශයේ ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන ඩෙංගු රෝගය මර්දනය සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රමදානයක් සංවිධානය කර ඇත. මේ කටයුත්ත පිළිබඳ ප්‍රදේශවාසීන් දැනුවත් කිරීම අවශ්‍ය වේ. ඒ සඳහා සුදුසු දැන්වීම් පත්‍රිකාවක් පිළියෙල කරන්න.
(ලකුණු 20යි.)

ඉ. (i) ඔබ පාසලේ විදුහල්පතිතුමා විශ්‍රාම ලබන දිනයේ දී එතුමාට පිළිගැන්වීම සඳහා සුබ පැතුම් පත් නිර්මාණය කිරීමට පන්ති කාමර මට්ටමින් සැලසුම් කර ඇත. ඒ සඳහා ඔබ ඉදිරිපත් කරන සුබ පැතුම් පත සකස් කරන්න.

(ii) පාසලේ පරිසර නියමු කණ්ඩායමේ සාමාජිකයෙකු වන ඔබට පාසල් ඔසු උයන නවීකරණය කිරීමේ කටයුත්ත පැවරී ඇත. එම ඔසු උයන් ව්‍යාපෘතිය පිළිබඳ දැනුවත් කිරීමට සුදුසු පෝස්ටරයක් නිර්මාණය කරන්න.

(ලකුණු 20යි.)



(1) WWW.PastPapers.WiKi (1)

PAST PAPERS WIKI

CamScanner